රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක රාව්‍යදෙ/44

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය,
කොළඹ 1.
2007.07.31

සියලුම අමාත්‍යංශ ලේකම්වරුන් වෙත

<u>රාජ්‍ය ව්‍යාපාර වලට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අදාළත්වය</u>

ඉහත කරුණට අදාලව නිකුත් කර ඇති අංක පීඊඩී/40 හා 2006.09.27 දින දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අමතරවයි.

කිසියම් පනතකින් විශ්‍රාම ගැනීමේ වයස තීරණය වන ආයතන හැර අනිකුත් රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සේවකයින්ගේ වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 55 විය යුතුය. එම සීමාවෙන් ඔබ්බට සේවය ලබාගැනීම අදාල නිලධාරින්ගේ/සේවකයින්ගේ එකඟතාවය මත ඔවුන්ගේ සේවා තත්ත්වය, හැසිරීම, පැමිණීම, කාර්යක්ෂමතාවය සහ සෞඛ්‍ය තත්ත්වය ආදිය සලකා බලා සේවා කාලය වයස අවුරුදු 57 දක්වා වසරින් වසර සේවා දිගු ලබාදීමට  ආයතනයේ පාලක මණ්ඩලයට හැකිය. ආයතනය විධිමත්ව පවත්වා ගෙන යෑම සඳහා පළපුරුද්දක් ඇති නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය බවත්, අවශ්‍ය කාලය තුළ එවැනි නිලධාරියෙක් සොයා ගැනීම අපහසු බවත් අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරනවා නම් පමණක් විශේෂඥ සේවා සපයන නිලධාරින්/සේවකයින් හට අවුරුදු 57 න් ඔබ්බට අවුරුදු 60 දක්වා වසරින් වසර සේවා දිගු ලබා දීමට පත්වීම් බලධාරියාට කටයුතු කල හැකිය.

ඉහත සඳහන් ආයතනවල ඉහළ කළමනාකරණයේ නිලධාරින් විශ්‍රාම යෑමේදී එම පුරප්පාඩුව පිරවීම සඳහා කල්වේලා ඇතිව සුදුසු අනුප්‍රාප්තිකයින් පත්කර ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීමට ආයතන ප්‍රධානියා විසින් ක්‍රියා කලයුතු වේ.

මෙම චක්‍රලේඛයේ සඳහන් කර ඇති කරුණු ඔබ යටතේ ගැනෙන රාජ්‍ය සංස්ථා, රජය  සතු සමාගම් සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සභාපතිවරුන් ගේ අවධානයට යොමු කරන්න.

වැඩි විස්තර ලබාගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ.පී.ඉන්ද්‍රන් මහතා විමසන්න. (දු.අ. 2484623)

මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2007.08.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් - (1) ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය
(2) විගණකාධිපති
(3) ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම් සභාව